මැදදුම්බර ප්‍රාදේශීය සභාව

මහනුවර දිස්ත්‍රික්කය

----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මැදදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ විවිධ ප්‍රතිපාදන මත ගොඩනැගිලි සංවර්ධනය සඳහා අවස්ථා 16 කදී දරා තිබුණු රු.10,360,591 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල ගබඩා තොගයේ පැවති රු.366,000ක් වටිනා ජලමනු 122 ක් හා රු.389,620 ක් වටිනා ජල උපකරණවල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ස්ථාපිත කර තිබූ රු.255,663 ක් වටිනා අභ්‍යන්තර දුරකථන පද්ධතිය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

සභාව විසින් අංක 252 - 6479 දරන කැබ්රථයේ ඇස්කීසි නියෝගය නිදහස් කර ගැනීම සඳහා බාහිර පාර්ශවයකට එරෙහිව සභාව පැවරූ නඩුව සහ යෝජිත ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර බදු දීම, පාරවල් කැපීම, අනවසර ඉදිකිරීම්, වරිපනම් ගාස්තු ගෙවීම හා මූලික අයිතිවාසිකම් කඩවීම් ආදී කරුණු සම්බන්ධව පිළිවෙලින් සභාවට එරෙහිව පැවරූ නඩු 26 ක් හා නඩු 16 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතු වටිනාකම රු.18,011,397 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයකට අනුව වසර 1-5 අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.7,166,779 ක් හා වසර 5 කට වඩා වැඩි කාලයක් නිරවුල් නොකල ශේෂවල වටිනාකම රු.531,240ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 3 ක එකතු වටිනාකම රු.31,318,769 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයකට අනුව වසර 1-5ත් අතර කාලයක් නිරවුල් නොකල ශේෂ එකතුව රු.16,801,356 ක් වූ අතර, වසර 5ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.2,108,103ක් විය.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම
---------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.24,428,306 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම
---------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | **නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් 6 ක සියයට 1 ක බදු මුදල ලබා ගැනීමේදී සංචාරක මණ්ඩලයට ඉදිරිපත් කරන ගිණුම් ප්‍රකාශන පදනම්කර නොගෙන කළමනාකරු විසින් ලබා දුන් ආදායම් වාර්තාවක් පදනම් කරගෙන තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 571 (2)(ආ) ඡේදය | වසර 2 ක් ඉක්ම වූ රු.1,744,450 ක් වටිනා තැන්පතු 108 සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 762 | අවශ්‍යතාවය හඳුනා නොගෙන රු.970,200 ක් වටිනා පීවීසී බට, සොකට් හා වැල් ඇතුලු ජල උපාංග මිලදී ගෙන ගබඩාවේ රඳවාගෙන තිබුණි. |
| (ඇ) 1980 දෙසැම්බර් 31 දිනැති 1980/46 හා 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | කඩ කාමර අතුරු බදු දීම සම්පූර්ණයෙන් තහනම් වුවද, බදුකරුවන් විසින් අතුරු බදු දීම සිදුකර තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,327,811 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,579,546 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.251,735 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ රු.251,735 ක අඩුවීම කෙරෙහි වෙනත් ආදායම්, ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තු වියදම් වැඩිවීමද, කුළී හා සේවා සඳහා ගාස්තු ආදායම අඩුවීමද ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයේ මුළු ජංගම වත්කම් හා මුළු ජංගම වගකීම් අතර අනුපාතය පිළිවෙලින් 2.2:1 සහ 1.7:1 ක් විය.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 වරිපනම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.2,410,910 ක් වූ හිඟ ශේෂයක් පැවතියද, වර්ෂය තුළ ඉන් අයකරගෙන තිබුණේ රු.559,016 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 23 ක අගයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.2,246,265ක් වූ අතර, එම ශේෂය තුළ වසර 5 ක කාලයක් ඉක්මවූ රු.1,287,904 ක් වූ ශේෂ ඇතුළත්ව තිබුණි.

2.4.2 බදු කුලී
----------
පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි බදු කුලී ශේෂය රු.1,837,668ක් වූ අතර, වර්ෂ 5 කට වඩා පෙර සිට පැවත එන හිඟහිටි ශේෂය රු.1,277,307ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කඩ කුලී ශේෂය රු.1,817,319 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 1-5 ත් අතර කාලයක සිට අයවිය යුතු රු.927,955 ක් ශේෂයක්ද විය.

2.4.3 බලපත්‍ර ගාස්තු
------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි බලපත්‍ර ගාස්තු ශේෂය රු.74,850 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 1-5 ත් අතර කාලයක සිට අයවිය යුතු රු.60,850 ක ශේෂයක් විය.

2.4.4 වෙනත් ආදායම්
------------------

(අ) රථ වාහන කුලී ආදායම්
---------------------------
සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.1,727,850 ක හිඟ ශේෂයක් පැවති අතර, බිල් කිරීම් රු.424,080 ක් විය. මෙම ශේෂයන්ගෙන් වර්ෂයේ අය කිරීමේ ප්‍රතිශතය සියයට 18 ක් හා 36 ක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,676,060ක හිඟයක් පැවති අතර, ඉන් වර්ෂ 5 ක කාලයක් ඉක්මවූ රු.418,860ක ශේෂයක් විය.

(ආ) අක්කර බදු
------------
(i) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.122,523 ක් වූ හිඟ ශේෂයක් පැවතියද, වර්ෂය තුළ ඉන් අයකරගෙන තිබුණේ රු.41,512 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 33 ක තරම් ඉතා අඩු අගයක් විය.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි අක්කර බදු ශේෂය රු.100,000 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 5 ක කාලයක් ඉක්මවූ රු.50,333 ක් වූ ශේෂ ඇතුළත්ව තිබුණි.

(ඇ) ජල ගාස්තු
------------
සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.1,145,630 ක හිඟ ශේෂයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.601,205 ක මුදලක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 52 ක අගයක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.1,094,893 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 05 ක කාලයක් ඉක්මවූ රු.334,590ක් වූ ශේෂ ඇතුළත්ව තිබුණි.

2.4.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු
------------------------------
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,369,132 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.6,732,797 ක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------
3.1 කාර්යසාධනය
-----------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාව විසින් තෙල්දෙණිය පොදු වෙළඳපලේ කඩ කාමර සංකීර්ණයක් ඉදිකිරීමට යෝජනා කර වසර 7 ක් ගතවී තිබුණද ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත මීරියගොල්ල තාවනේ වැව ප්‍රතිසංස්කරණය කර 2013 දෙසැම්බර් මස 20 වෙනි දින මැදදුම්බර ප්‍රාදේශීය සභාවට පවරා දී තිබුණි. මෙහි ප්‍රධාන අරමුණ ගම්මාන 6 ක පදිංචි පවුල් 3500 කට පානීය ජලය සැපයීම වුවත්, ජලය ලබා දීමට කටයුතු කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු ගොඩනැගිල්ලක ඉහල මාලයේ කඩ කාමර පහත මාලයේ බදුකරුවන්ටම ටෙන්ඩර් පරිපාටිය අනුගමනය නොකර එකවර බදු මුදල් (Key Money) අය නොකර ලබා දී තිබුණි.

(ආ) රු.22,632,425 ක වියදමක් දරා ඉදිකර තිබුණු රැස්වීම් ශාලාව 2016 ජනවාරි 23 දින සභාව වෙත පවරා දී තිබුණි. රැස්වීම් පැවත්වීමට නොහැකි තරම් අපවිත්‍ර වී තිබුණු අතර, ඇතැම් ස්ථානවල සිවිලින් ෂීට් කැඩී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මෙම රැස්වීම් ශාලාව දින 5 ක් කුලියට ලබා දී රු.9,000 ක ආදායමක් උපයාගෙන තිබුණි.

(ඇ) තෙල්දෙණිය මාළු වෙළඳසැල 2013 වර්ෂයේ සිට ටෙන්ඩර් කරුවකු ඉදිරිපත් නොවීම නිසා වසා දමා තිබූ අතර අවම ටෙන්ඩර් මුදල සමඟ සැසඳීමේදී රු.1,083,000 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි. කඩ කාමරය අළුත්වැඩියා කර වෙනත් වෙළඳාමක් සඳහා හෝ ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පොදු වෙළඳපලේ A දරන ගොඩනැගිල්ලේ අංක 8 දරන කඩ කාමරය ටෙන්ඩර් ගත් බදුකරුවාට එහි භුක්තිය භාරදීමට සභාව අපොහොසත් වීම මත බදුකරු විසින් රු.800,000 ක අලාභයක් ඉල්ලා සභාවට එරෙහිව නඩු පවරා තිබුණි. සභාවේ නිලධාරීන් උසාවියේ පෙනී නොසිටීම හා කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභාව භාරයේ තිබුණු අංක 252 - 6479 දරන කැබ්රථය ඇස්කිසි නියෝගයක් මගින් තහනමට ලක්කර තිබුණි.

(ඉ) මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු 7 ක පුරප්පාඩු 9 ක් පැවතුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු සතිපොළ, ගවමස් හා මාළු කඩ බදුදීමට අදාළව 2009 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දක්වා රු.1,113,246 ක ආදායමක් අයකර ගෙන නොතිබුණි.

(ආ) ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කමර හා ඉඩම් බදුදීමට අදාළව සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට රු.2,359,972 ක මුදලක් අයවිය යුතුව ඇතත්, මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පොළ භූමියේ තිබූ කඩ කාමර ඉවත්කර නව වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමට යෝජනා කර තිබූ අතර, මෙහිදී අවිධිමත් ලෙස බදුකරුවන් 92 දෙනෙක් තෝරාගෙන රු.20,301,000 ක මුදලක් ලබාගෙන ස්ථාවර තැම්පතුවක ආයෝජනය කර තිබුණි. 2009 මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට යෝජනා වී තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකර නොතිබුණි.

(ඈ) ගබඩාවේ පැවති ජල උපකරණ තොගය පිළිබඳව 2016 නොවැම්බර් 23 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී භාණ්ඩ 97ක අතිරික්තයක් හා භාණ්ඩ 506 ක ඌනතාවයක් පැවැතුණි.

(ඉ) 2014 හා 2015 වර්ෂ දෙක තුළ ලැබී තිබූ අනවසර ඉදිකිරීම් 18 ක් සම්බන්ධයෙන් සොයා බලා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණ රු.160,728 ක අත්තිකාරම් ශේෂය හා රු.24,082 ක් වූ එකතුකල අගය මත බදු මුදල නිරවුල් කර නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

(අ) යතුරු පැදි 2ක් හා ජීප් රථයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව සභා භූමියේ පැවතුණි.

(ආ) ප්‍රාදේශීය සභාව සතු උප කාර්යාල 3 ක් වසර ගණනාවක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) 2014 පළාත් නැගුම සංවර්ධන යෝජනා යටතේ ඉදිකර තිබූ උඩිස්පත්තුව පොළ 2016 ජනවාරි 26 දින සභාව වෙත පවරා දී තිබුණද, 2016 දෙසැම්බර් මාසය වන තෙක්ම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

ඌන සංවර්ධිත/ හුදකලා ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ රඹුක්පොත කෝට්ටවත්තගම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු.500,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර ප්‍රතිලාභීන් 4 ක් වූ බැවින් ඉදිකිරීම නතර කර තිබුණි. ව්‍යාපෘතිය නීති, රීති අනුව තෝරා නොගැනීම නිසා කොන්ත්‍රාත්කරු දැරූ වියදම් සඳහා රු.75,000 ක් ගෙවීමට සිදුවී තිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මැදමහනුවර සතිපොළ සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියනයක ප්‍රතිපාදන මුදලක් ලැබී තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව මූල්‍ය හැකියාවක් නොමැති ගලේමැදුර ගොවි සංවිධානයට ලබාදී තිබුණද, සභාවේ කාර්මික නිලධාරියකු විසින් ඉටුකර ගොඩනැගිල්ලේ පතුල සඳහා ප්‍රමිතියෙන් තොර වැරගැන්නුම් කම්බි යෙදූ බව අනාවරණය වීමෙන් පසු කර්මාන්තයේ වැඩ නතර කර තිබුණි. ඉදිකිරීම් සිදුකිරීමේදී විධිමත්ව ටෙන්ඩර් ප්‍රදානය නොකිරීමෙන් ප්‍රතිපාදන ආපසු යැවීමට සිදු වී තිබුණි.

(ආ) 2016 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සභාව සතු ළමා උද්‍යානයේ තාප්පය ඉදිකිරීම සඳහා රු.663,925 ක් වටිනා ද්‍රව්‍ය මිලදීගෙන තිබූ නමුත් ඉන් සිමෙන්ති මිටි 200 ක් අදාළ වෙළඳ ආයතනය තුළද මැටල් හා වැලි ළමා උද්‍යානය තුලද දමා තිබුණි.

## 3.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන මෙට්‍රික් ටොන් 4 ක පමණ කසල සභාවේ ට්‍රැක්ටර් හා සේවකයින් යොදවා එකතු කර තිබූ නමුත් කසල වෙන්කර ලබා ගැනීමක් සිදු නොකර තෙල්දෙණිය පොදු ක්‍රීඩාංගණය අසල මහවැලි අධිකාරිය සතු ඉඩමකට බහැර කර පස් දමා වසා දැමීම සිදුකර තිබුණි. ඒ අනුව ප්‍රදේශයේ එකතුවන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීමෙන් තොරව පරිසරයට හානිවන අයුරින් බැහැර කර තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) වැය විෂයයන් 13 ක් සඳහා සලසා දී තිබුණු රු.1,408,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 12 ක ශුද්ධ ප්‍රතිපාදන හා තථ්‍ය වියදම අතර සියයට 60 සිට සියයට 98 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

## 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහාද වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

සභාවේ විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුල කමිටු රැස්වීම් 3 ක් පමණක් පවත්වා තිබුණි.

## 5. පද්ධති හා පාලනය

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ගිණුම්කරණය
(ඇ) වාහන පාලනය
(ඈ) ආදායම් පාලනය
(ඉ) ණයගැතියෝ සහ ණයහිමියෝ
(ඊ) කොන්ත්‍රාත් පාලනය
(උ) ගබඩා පාලනය